


## සංස්කරණය ලක්ෂ්මන් කොඩිතුවක්කු

**ලංකාරාමයේ කඨින උත්සවය**

සිඩ්නි නුවර ලංකාරාමයේ කඨින මහා උත්සවය 22 වන සෙනසුරාදා ඉතා සාර්ථක අන්දමින් පැවැත්විණි. කඨින පෙරහැර, කඨින චීවරය පූජා කිරීම වැනි ආගමික වතාවත් වලින් සමන්විත වූ මේ උත්සවයට සිඩ්නි නුවර වාසය කරන කුඩා දරුවන්ගේ සිට වැඩිමහල් බෞද්ධ බැතිමතුන් විශාල පිරිසක් සහභාගි විය.

**සිංහල සංස්කෘතික හමුවේ මහා සභා රැස්වීම**

සිඩ්නි නුවර සංස්ථාපිත සිංහල සංස්කෘතික හමුවේ මහා සභා රැස්වීම පසුගිය ඉරුදින උැබචිඅදරචියඅසකකැ ප්‍රජාශාලාවේදී පැවැත්විණි. මෙහිදී නව සභාපති වශයෙන් අතුල අමරසිංහ ද උප සභාපතිවරුන් වශයෙන් මහේෂ් බණ්ඩාර, සෑම් සමරසිංහ, තිස්ස ලියනගේ, ෂ්‍යාමා අමරසිංහ ද ලේකම් වරු වශයෙන් රෙජී දිසානායක හා රූපිකා අමරතුංග ද භාණ්ඩාගාරික වශයෙන් ලලිත් අත්තනායක යන මහත්ම මහත්මීහු තේරී පත් වූ හ.

**ඔස්ට්‍රේලියා නව කම්කරු නීති පවුල් සංස්ථාවට බලපාන්නේ කෙසේ ද? සම්මන්ත්‍රණයක්.**

ඔස්ට්‍රේලියාවේ නව කම්කරු නීති පවුල් සංස්ථාවට බලපාන්නේ කෙසේද යන මාතෘකාව යටතේ නිව් සවුත් වේල්ස් හි ප්‍රධාන පෙලේ වෘත්තීය සමිති නායකයින් දේශණා පැවැත් වූ සම්මන්ත්‍රණයක් පසුගිය සෙනසුරාදා ග්ලෙන්වුඩ් ප්‍රජා හාලාවේ දී පැවැත්විණි. මෙය සංවිධානය කරන ලද්දේ රස එෆ් එම් සංස්කාරක ජගත් බණ්ඩාර විසිනි.

**ස්පර් සංවිධානයේ ආහාර සල්පිල**

ලංකාවේ මායිම් ගම් වල වෙසෙන අසරණ දරුවන්ගේ සුබසාධක කටයුතු වලට ආධාර පිනිස සිඩ්නි නුවර ස්පර් සංවිධානය මගින් සංවිදානය කළ ආහාර සල්පිලක් පසුගිය දා රොසෙලී ප්‍රජා හාලාවේ දී පැවැත්විණි.

**සාහිත්‍ය චින්තා උත්සවයේ ත්‍යාගලාභීන්**

එස්බීඑස් ගුවන් විදුලිය හා ස්කැට්ස් සංවිධානය එක්ව ඉදිරිපත් කළ සාහිත්‍ය චින්තා පද්‍ය තරගමාලාවේ සහතික ලාභීන් මෙසේ ය.

| | | |
|---|---|---|
| නිදහස් පද්‍ය - | පළමු ස්ථානය - | රසිකා පෙරේරා සිඩ්නි |
| | දෙවන ස්ථානය - | විනීතා තලේරත්න මෙල්බන් |
| | තෙවන ස්ථානය - | අයි ජේ කැරොලයින් |
| සඳැස් කවි | පළමු ස්ථානය - | ලක්ෂ්මී දම්මුල්ල |
| | දෙවන ස්ථානය - | රුක්මලී දසනායක |
| | තෙවන ස්ථානය - | එච් එච් කරුනාරත්න සිඩ්නි<br>පද්මසිරි හේරත් |

## පර්ත් පුවත්




ඔස්ට්‍රේලියාවේ විවිධ ප්‍රාන්ත වලින් බිහි වන සිංහල සඟරා කියැවීමේ භාග්‍යය අපට නිතර ලැබෙයි. එනමුදු බටහිර ඔස්ට්‍රේලියාවේ සිට අප අතට පත්වුණ පළමු සිංහල සඟරාව වි ක ධර්මබන්ධු ශූරීන් සංස්කරණය කළ සංදේශය සඟරා-වයි.

**බුදුමැදුර විවෘත කිරීම හා කඨින පූජෝත්සවය**

පර්ත් ශ්‍රී ලංකා විහාරයේ ධර්මශාලාව සහිත බුදුමැදුර විවෘත කිරීම 2005 නොවැ 11 වන සිකුරාදා සිදු වෙයි. ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලා 10 නමකට ආසන්න මහා සංඝයා වහන්සේ ලා ප්‍රධාන ගිහි පින්වතුන් රැසක් මෙම අවස්ථාවට සහභාගි වනු ඇත.
මෙදින රාත්‍රී 7 ට පළමුව ආගමික වතාවත් ඉටුකිරීමෙන් බුදුමැදුර විවෘත වේ. අනතුරුව කෙටි උත්සව සභාවකි. එදිනම රාත්‍රී 9 සිට පසුදා පහන් වන තුරු සර්වරාත්‍රික පිරිත් ද්ශනයයි. මෙය සර්වරාත්‍රික පිරිත් ද්ශණයක් ශ්‍රී ලාංකික සම්ප්‍රදායට පර්ත් නුවරදී පැවැත්වෙන ප්‍රථම අවස්ථාවයි.

නොවැ 12 උදෑස 7 ට කඨින වස්ත්‍රය මහා සංඝයා වෙත පූජා කිරීමත් එදිනම චීවරය පිළියෙල කොට සඟ සතු කිරීමත් සිදුවේ. කඨිණානිසංස ධර්ම දේශණය 13 වන ඉරිදා රාත්‍රී 7 ට පැවැත් වේ..

## කෑමට පසු.....

අකද්කදකොරොස් ලියයි







### කෝපය නොසන්සිඳීම විපතට හේතු වෙයි

අක්කොච්ච් මං අවරි මං
අජිනි මං අහාසි මේ
යේ තං උපනයිහන්තී
වේර තේසං න සම්මති

දොස් කීවේ ය ඔහු මට
මා සතු සේ පැහැර ගත්තේ ය මාගෙන්
මෙපරිදි සිතුවොත් ක්‍රෝධය රැඳුණු සිතකින්
වෛරය ඔවුන්ගේ නොමැත සංසිඳීමක්

Akkocchi mam avadhi mam
Ajini mam ahasi me
Ye tam upanayhanti
Veram tesam na sammati

He abused me, he beat me,
He defeated me, he robbed me,
In those who harbour such thoughts
Hatred is not appeared

**නිධාන කතාව**

වරද නොපිලිගැනීමක්

සිදුහත් කුමරුගේ නැන්දනියගේ පුතෙක් වූ තුල්ලතිස්ස නම් තෙර නමක් දෙව්රම් වෙහෙරෙහි වැඩ විසූ හ. මේ තෙරුන් වහන්සේ මහළුව පැවිදි වූ කෙනෙකි. ඒ තෙරුන් වහන්සේ වයසින් වැඩි වුවත් ගුණයෙන් උසස් නැත. බුදුරජානන් වහන්සේගේ නෑ සබඳකම් හේතුවෙන් ඒ හිමියෝ බොහෝ උඩඟුව බුදුහිමියනට ලැබෙන දෙයින් රිසි සේ යැපෙමින් තරව වැඩුණු සිරුරැතිව උවටැන් හලෙහි වසන්නේ ය. ඒ හිමියනට වඩා උසස් ගුණ යහපත් කිසිම තෙර නමකට ද ගරු සරු දක්වන්නේ නැත.

දෙව්රම් වෙහෙරට පිටතින් වැඩම වන මහ තෙරුන් වහන්සේලා මේ මහ තෙරුන් වහන්සේ නමකැයි සිතා තුල්ලතිස්ස තෙරුන් වහන්සේට රැවටෙති. උවමනා එපා කම් ද අසති. මේ ගැන උරණ වූ තරුණ හිමි නමක් මහලු තුල්ලතිස්ස හිමියන් ට දොස් නැගූහ. මේ ගැන කිපුණු තුල්ලතිස්ස හිමියන් දුක්මුසු විලසින් බුදු හිමියන් වෙත එළඹ පැමිණිළි කළේ ය.

බුදුරජානන් වහන්සේ ඒ තෙරුන්ගෙන්ම දොස් නිදොස් බව විමසූහ. වැඩි හිටියනට වතාවත් නොකිරීම ද බොහෝ දෙන නිතර රැස්වන වෙහෙර මැද උවටැන් හලේ නිකරුණේ හිඳීම ද වරදකි. ඒවායෙහි වරද පෙන්වා දී එම වරද වලින් මිදෙනු සඳහා සඟ,න් කමාකර ගත යුතු බව වදාළ සේ ක. ඒ උතුම් බුදු වදන පවා නොසලකා කළ වරද පිළිගැනීමට අකැමැතිව අකීකරුව සිටියේ ය. බුදුරජානන් වහන්සේ ඒ තෙරුන් පෙර ආත්ම වලදී ද මෙසේ රළු පරළු ගති ඇතිව අකීකරුව සිටි බව දක්වා කළ වරද පිළිගැනීමේ අගය දක්වා කෝප සහගත වෛර බැඳුම් සිහිකිරීම් වසයෙන් සිත්හි පැවැත්වීමෙන් නොසන් සිඳෙන බව ද වරද මෙනෙහි නොකොට අමතක කොට දුරු කිරීමෙන් වෛරය මනාව සන්සිඳෙන බවද වදාළ සේක